ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

තනතුරු පුරප්පාඩු

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අවශ්‍ය වේ.

(01) සාමාන්‍යාධිකාරී (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාජීය විද්‍යාව / විද්‍යාව / කෘෂිකර්මය / රාජ්‍ය පරිපාලනය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්

සමග

සමාජීය විද්‍යාව / විද්‍යාව / කෘෂිකර්මය / රාජ්‍ය පරිපාලනය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

හා

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, වෙනත් රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 18 ක පළපුරුද්දක් ලබා තිබීම. එම පළපුරුද්දෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ කාර්යභාරයන්හි සනාථ කළ විශිෂ්ට සේවා වාර්තාවක් සහිතව වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම

2. ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

හා

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක වෙනත් රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 18 ක පළපුරුද්දක් ලබා තිබීම.

3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාජීය විද්‍යාව / විද්‍යාව / කෘෂිකර්මය / රාජ්‍ය පරිපාලනය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්

හා

සමාජීය විද්‍යාව / විද්‍යාව / කෘෂිකර්මය / රාජ්‍ය පරිපාලනය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් ලබා තිබීම

හා

ප්‍රථම උපාධියෙන් පසු රජයේ සංස්ථාවක / මණ්ඩලයක හෝ වෙනත් පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ කාර්යභාරයන්හි සනාථ කළ විශිෂ්ට සේවා වාර්තාවක් සහිතව අවම වශයෙන් වසර 5 ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

ක්ෂේත්‍රයට අදාළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (HM 1-3) අවම වශයෙන් වසර 5 ක සතුටුදායක සේවාවක් සම්පූර්ණ කොට තිබීම

හා

බහුවිධ කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමේ හා මෙහෙයවීමේ හැකියාව පෙන්නුම් කොට තිබීම, විධිමත් හා කාර්යක්ෂම ලෙස මානව හා අනෙකුත් සම්පත් මෙහෙයවීම හා කළමනාකරණය කිරීමේ පළපුරුද්දක් ලබා තිබීම.

සේවා ශ්‍රේණිය හා මාසික වැටුප් පරිමාණය :

HM 2-1 රු : (44.030-12x1,310-59.750)

වයස : අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(02). නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාජීය විද්‍යාව / විද්‍යාව / රාජ්‍ය පරිපාලනය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්

සමග

සමාජීය විද්‍යාව / විද්‍යාව / රාජ්‍ය පරිපාලනය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

හා

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, වෙනත් රජයේ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

2. ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

හා

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, වෙනත් රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. ක්ෂේත්‍රයට අදාළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (HM 1-1) අවම වශයෙන් වසර 5 ක සතුටුදායී සේවා පළපුරුද්දක් ලබා තිබීම.

සේවා ශ්‍රේණිය හා මාසික වැටුප් පරිමාණය :

HM 1-3 රු : (41,745-15x1,100-58,245)

වයස : අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(03) කළමනාකරු - (පරිපාලන හා මානව සම්පත්) (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / ව්‍යාපාර පරිපාලනය / සමාජීය විද්‍යාව / විද්‍යාව හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්

සමග

කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / ව්‍යාපාර පරිපාලනය / සමාජීය විද්‍යාව හෝ විද්‍යාව විෂයයන්ට අදාළව ලබාගත් පශ්චාත් උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

හා

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, වෙනත් රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්දක් ලබා තිබීම.

2. ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

හා

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, වෙනත් රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM 1-1) 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5 ක සතුටුදායී සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

(04) කළමනාකරු - (මූල්‍ය) (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මූල්‍ය / ගණකාධිකරණය / වාණිජ්‍ය / කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක්

සමග

ක්ෂේත්‍රයට අදාළව ලබාගත් මූල්‍ය / ගණකාධිකරණය / වාණිජ්‍ය / කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

හා

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, වෙනත් රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්දක් ලබා තිබීම.

2. ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

හා

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලය, වෙනත් රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM) 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5 ක සතුටුදායී සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

(05) කළමනාකරු- (සැලසුම් හා තොරතුරු) (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජනසංඛ්‍යාවිද්‍යාව / කළමනාකරණය / සමාජ විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක්

සමග

ජනසංඛ්‍යාවිද්‍යාව / කළමනාකරණය හෝ සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම

හා

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, වෙනත් රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්දක් ලබා තිබීම

2. ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

හා

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක වෙනත් රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM) 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5 ක සතුටුදායී සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

(06) කළමනාකරු - (නීති) (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධියක් සමග නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම

සමග

නීතිය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා තිබීම

සහ

රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 12 ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ (MM) 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5 ක සතුටුදායී සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම සමග ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස දිවුරුම් දී තිබීම.

ඉහත සඳහන් තනතුරු අංක 03,04,05 සහ 06 සඳහා වූ පොදු කරුණු

සේවා ශ්‍රේණිය හා මාසික වැටුප් පරිමාණය :

HM 1-1 රු: (38,530-15x1,100-55,030)

වයස : අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(07) අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධියක් සමග වසරක පශ්චාත් වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.
2. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අන්තර් මධ්‍ය විභාගය සමත්ව තිබීම සමග වසරක පශ්චාත් වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)

1. ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. ක්ෂේත්‍රයට අදාළ ආශ්‍රිත නිලධාරී (MA 3) සේවා ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5 ක සතුටුදායී සේවා පළපුරුද්දක් ලබා තිබීම.
3. ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1) II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5 ක සතුටුදායී සේවා පළපුරුද්දක් ලබා තිබීම.

(08) පර්යේෂණ හා සුබසාධන නිලධාරී (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාජ විද්‍යාව / සමාජයීය විද්‍යාවන් / සෞඛ්‍ය ප්‍රවර්ධනය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)

1. ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් සපුරා තිබීම.
2. ක්ෂේත්‍රයට අදාළ ආශ්‍රිත නිලධාරී (MA 3) සේවා ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5 ක සතුටුදායී සේවා පළපුරුද්දක් ලබා තිබීම.
3. ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1) II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5 ක සතුටුදායී සේවා පළපුරුද්දක් ලබා තිබීම.

ඉහත සඳහන් තනතුරු අංක 07 සහ 08 සඳහා වූ පොදු කරුණු

සේවා ශ්‍රේණිය හා මාසික වැටුප් පරිමාණය :

JM 1-1 2006:A: රු: (20,525-10x365-18x550-34,075)

වයස : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(09) භාෂා පරිවර්තක - ඉංග්‍රීසි (තනතුරු 01)

සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස ඇතුළත් ප්‍රථම උපාධිය සමග අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල විෂයය සඳහා සම්මාන සාමාර්ථ සමග සිංහල - ඉංග්‍රීසි හා ඉංග්‍රීසි - සිංහල පරිවර්තනය පිළිබඳ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

(10) භාෂා පරිවර්තක - දෙමළ (තනතුරු 01)

සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දෙමළ භාෂාව විෂයයක් ලෙස ඇතුළත් ප්‍රථම උපාධිය සමග අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල විෂයය සඳහා සම්මාන සාමාර්ථ සමග සිංහල - දෙමළ හා දෙමළ - සිංහල පරිවර්තනය පිළිබඳ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

ඉහත සඳහන් තනතුරු අංක 09 සහ 10 සඳහා වූ පොදු කරුණු

භාෂා පරිවර්තනය පිළිබඳ ඩිප්ලෝමාවක් තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

සේවා ශ්‍රේණිය හා මාසික වැටුප් පරිමාණය :

MA 4 2006:A: රු:(18,230-10x365 -15x450 -05x550- 31,380)

වයස : අවුරුදු 23 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

(11) මූල්‍ය සහකාර (තනතුරු 02)

සුදුසුකම් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මූල්‍ය / ගණකාධිකරණය / වාණිජ්‍ය / කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධිය ලබා තිබීම.
2. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අන්තර් මධ්‍ය විභාගය සමත්ව තිබීම සමග වසරක පශ්චාත් වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම.

(12) මාධ්‍ය සහකාර (තනතුරු 03)

සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජනසංනිවේදනය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්.

(13) අන්තර්ජාල ආවේක්ෂණ සහකාර (තනතුරු 01)

සුදුසුකම් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධිය ලබා තිබීම.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධිය සමග තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

(14) නීති සහකාර (තනතුරු 02)

සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධිය සමග නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම.

(15) උපදේශන සහකාර (තනතුරු 02)

(16) චිකිත්සක (තනතුරු 01)

සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මනෝවිද්‍යාව / සමාජ විද්‍යාව / සෞඛ්‍ය ප්‍රවර්ධනය / විශේෂ අවශ්‍යතා පිළිබඳ අධ්‍යාපනය / කථන හා ශ්‍රවණ විද්‍යාව / නාට්‍ය හා රංග කලාව පිළිබඳ ප්‍රථම උපාධිය ලබා තිබීම.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

(17) පුස්තකාලයාධිපති (තනතුරු 01)

සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පුස්තකාල විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

ඉහත සඳහන් තනතුරු අංක 11,12,13,14,15,16,17 සඳහා වූ පොදු කරුණු

සේවා ශ්‍රේණිය හා මාසික වැටුප් පරිමාණය :

MA 3 2006 A : රු: (15,600-10x215-4x240-15x320-7x360-26,030)

වයස : අවුරුදු 23 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(18) කළමනාකරණ සහකාර - තාක්ෂණික - (1929 ළමා උපකාරක දුරකථන සේවය) (තනතුරු 07)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික හෝ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන තොරතුරු තාක්ෂණය / කාර්යාල කළමනාකරණය පිළිබඳ NVQ (ජාතික වෘත්තීමය සුදුසුකම්) 5 මට්ටමට නොඅඩු සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.

සේවා ශ්‍රේණිය හා මාසික වැටුප් පරිමාණය :

MA 2-1 2006:A:රු : (14,610-10x145-7x170-4x240-20x320-24,610)

වයස : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(19) කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (තනතුරු 03)

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

(අ). අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක්වරක දී

- සිංහල / දෙමළ
- ඉංග්‍රීසි භාෂාව
- ගණිතය යන විෂයයන් ඇතුළුව, විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත් වීම.

(ආ). අ.පො.ස. (උ/පෙළ) විභාගය විෂයයන් තුනකින් (03) (පොදු පරීක්ෂණයට අමතරව) සමත්වීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික සේවා ශ්‍රේණියේ පුහුණු, අර්ධ පුහුණු හා නොපුහුණු නිලධාරීන් හට අයදුම් කළ හැක.

අධ්‍යාපන :

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන්

- සිංහල / දෙමළ
- ඉංග්‍රීසි භාෂාව
- ගණිතය යන විෂයයන් ඇතුළුව, විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත් වීම.

වෙනත් :

ඉහත සේවා ශ්‍රේණියේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායී සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සටහන : ඉහත සඳහන් වසර 5 ක පළපුරුද්දක් ගණනට, ස්ථිර තනතුරකට අනුයුක්ත වීමට අවශ්‍ය ඕනෑම කාලයක පළපුරුද්දක් හෝ ඕනෑම තනතුරකට ස්ථිර පදනම මත අනුයුක්ත වීමට අවශ්‍ය පුහුණුව සම්පූර්ණ කළ යුතු ඕනෑම කාලයක් හෝ අනියම් / තාවකාලික පදනම මත සේවය කළ ඕනෑම කාලයක් අදාළ නොවේ.

සේවා ශ්‍රේණිය හා මාසික වැටුප් පරිමාණය :

MA 1-1 2006 : A : රු: (13,450-10x145-7x170-4x240-20x320-23,450)

වයස : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(20) රියදුරු (තනතුරු 01)

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් විෂයයන් 02 ක් සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6 කින් සමත්ව තිබීම

සහ

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු බරවාහන රියදුරු බලපත්‍රයක් සහිත වීම හා රියදුරු බලපත්‍ර ලබාගැනීමෙන් පසු රියදුරකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) ක පළපුරුද්ද සහිත වීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු බරවාහන රියදුරු බලපත්‍රයක් සහිත වීම හා රියදුරු බලපත්‍ර ලබාගැනීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) ක පළපුරුද්ද සහිත වීම

සහ

ප්‍රාථමික නුපුහුණු (PL1) ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5ක සතුටුදායී සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම

සේවා ශ්‍රේණිය හා මාසික වැටුප් පරිමාණය : PL3 2006: A : රු: (12,670-10x130-10x145-10x160-12x170 - 19,060)

වයස : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(21) පණිවුඩකරු (තනතුරු 01)

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීම

සහ

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු යතුරුපැදි බලපත්‍රයක් සහිත වීම.

සේවා ශ්‍රේණිය හා මාසික වැටුප් පරිමාණය : PL1 2006: A: රු: (11,930-10x120-10x130-07x145-15x160 - 17,845)

වයස : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

පොදු :

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, විශිෂ්ට චරිතයකින් යුක්ත වීම හා තනතුරට පවරන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම ජීව දත්ත අඩංගු අයදුම්පත් අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කළ හැකි සහතිකපත් වල සහතික කළ පිටපත් සහිතව හා තොරතුරු ලබාගැනීම සඳහා ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර සමග **2016.02.29 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් පහත සඳහන් ලිපිනය වෙත යොමු කළ යුතුය.**

අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තම අයදුම් කරන තනතුර සඳහන් කර තිබිය යුතු අතර, රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය.

අයදුම්කරුගේ අත්සන තබා නොමැති, සහතික කරන ලද සහතිකපත් වල පිටපත් අමුණා නොමැති, ඥාතීන් නොවන නිර්දේශකයන්ගේ තොරතුරු සඳහන් කර නොමැති, අසම්පූර්ණ හා අවසාන දිනට ප්‍රථම අධිකාරිය වෙත යොමු නොවන අයදුම්පත් සියල්ල කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, මෙම තනතුරු ලබාගැනීම සඳහා කවර ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත. මෙම පත්වීම් සියල්ල සම්බන්ධව අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,
නො. 330, තලවතුගොඩ පාර, මාදිවෙල,
ශ්‍රී ජයවර්ධනපුර.

වෙබ් අඩවිය : www.childprotection.gov.lk